C
370.9
RAM

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

# නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ද්විතීය අධ්‍යාපනයේ විෂය මාලා සංවර්ධන කටයුතු පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා අධී වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනයකි.

1987

එම්.එල්.කේ. රඹුක්වැල්ල
ශාස්ත්‍රවේදී (ලංකා) 1975
අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට සාමාර්ථය) 1982/83

නිබන්ධන උපදේශක :-

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්.පී. ලියනගේ මහතා

409923

## හැඳින්වීම

## (සාර සංග්‍රහය)


අධ්‍යාපනය තුළින් ජාතික අපේක්ෂාවන් ඉටුකරගැනීමට බලාපොරොත්තු වන කවර රටක් වුවත්, එම රටේ අධ්‍යාපන පද්ධතියේ පළමුවෙන්ම අවධානය යොමු කළ යුත්තේ එම අපේක්ෂාවන් ප්‍රායෝගිකව ඉටු කරන විෂය මාලාවට හා විෂය මාලා සංවර්ධන කටයුතු වලටය. ශ්‍රී ලංකාවේ ක්‍රි.ව. 2000 වනවිට ලොවේ දියුණුවන අන් රටවලට නොදෙවැනිව සිටීම අරමුණු කරගෙන, තාක්ෂණික පිම්මක් සඳහා කැස කවන මෙවන් අවධියක, අධ්‍යාපනය තුළින් කඩිනම් සංවර්ධනයක් ළඟා කරගැනීමට නම් පළමුවෙන්ම අවධානය යොමු කළ යුත්තේ විෂය මාලා සංවර්ධන කාර්ය භාරයටය.

එබැවින් නිදහස ලැබූ තැන් සිට ගතවූ අශක තුනහමාරක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ විෂය මාලා සංවර්ධන කටයුතු සඳහා දරණ ලද ප්‍රයත්නයන් හා ඒවායේ සාර්ථක අසාර්ථක භාවයන් ද ඓතිහාසිකව විමර්ශනය කොට අනාගතයට යෝග්‍ය විෂය මාලා සංවර්ධන වැඩ පිළිවෙල සකස් විය යුතු ආකාරයන්ද විමසා බැලීම බෙහෙවින්ම එලදායී මෙන්ම කාලෝචිත දෙයක් ලෙස මට හැඟී ගියෙන් එම කාර්යය ඉටු කිරීමේ අරමුණෙන් "නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ද්විතීය අධ්‍යාපනයේ විෂය මාලා සංවර්ධන කටයුතු පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්" යන මාතෘකාව මම ශාස්ත්‍රපති නිබන්ධය සඳහා තෝරා ගතිමි.

මෙම අධ්‍යයනයේදී මා වැඩි වශයෙන් අනුගමනය කළේ ඓතිහාසික ( Historical )සහ විස්තරාත්මක ( Descriptive )පර්යේෂණ ක්‍රමයන්ය .

මෙම ග්‍රන්ථය අවසානයේ මූලාශ්‍ර හා උපග්‍රන්ථ යටතේ සඳහන් කර ඇති, දෙස් විදෙස්හි කලින් කලට පලවූ පොතපත හා වෙනත් පල නොකළ කෘතීන් සමහරක් ද පරිශීලනය කරමින් සකස් කළ මෙම ශාස්ත්‍රපති නිබන්ධය පරිච්ඡේද 6කි. පිටු 292

හා මූලාශ්‍ර හා උපග්‍රන්ථ පිටු 14 කින්ද සමන්විතය.

මෙහි පළමුවන පරිච්ඡේදයෙන් ප්‍රස්තුතයට පිවිසීමට අර්ථවත් ජීඨාවරයක් සකස් කරගනු වස් "විෂය මාලාව" යන්න හැඳින්වීමට උත්සාහ කළෙමි. ඒ සඳහා විවිධ අධ්‍යාපනඥයින් කලින්කලට ඉදිරිපත් කළ අර්ථ සීමන හා විෂය මාලාව දෙස බලන ලද ආකෘති කෝණයන් ඔස්සේ ගොඩ නැගූ සංකල්පයන්ද උපයෝගී කරගතිමි. එම කොටස අවසානයේ විෂය මාලාව යන්නෙන් අද ගම්‍ය වන පුළුල් අර්ථය පැහැදිලි කිරීමට ප්‍රයත්නයක් දැරුයෙමි.

අනතුරුව විෂය මාලා සංවර්ධනය යන්නද එලෙසම විවිධ අධ්‍යාපනඥයන්ගේ නිර්වචන ඔස්සේ හඳුනා ගැනීමට ප්‍රයත්නයක් දරමින් සවිඥානකව සිදු කරනු ලබන විෂය මාලා සංවර්ධන කාර්යයන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම් ප්‍රයත්නයක් වශයෙන් විෂය මාලා ව්‍යාපෘතියක ඇති වැදගත්කම ද සාකච්ඡා කළෙමි.

විෂය මාලා සංවර්ධන කාර්යභාරය සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියේම සංවර්ධනාත්මක කාර්ය භාරයන් තුළින්ම සිදුවිය යුතු බවත්, පන්ති කාමරය තුළ සිදුවන අන්තර් ක්‍රියාකාරීත්වය එහි සාර්ථක අසාර්ථක භාවය කෙරෙහි බලපාන ආකාරයත්, විෂය විෂය ඉගැන්වීම යටතේ අන්තර් ක්‍රියාකාරීත්වයේ වැදගත් කමත්, ඒ යටතේ ගුරුවරයා, ඉගැන්වීම් ක්‍රම, ශිෂ්‍යයා, පරිසරයේ වැදගත් කමත්, අවධාරණය කර ඇත. මෙම අන්තර් ක්‍රියාකාරීත්වයේ සුවිශේෂී ස්ථානය හිමිකරගන්නා ගුරුවරයා සකස්කිරීමේ වැදගත්කම හා ඒ සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන ගුරු පුහුණුව කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරමින් එම කාර්ය භාරයද විමසුමට ලක් කර ඇත.

දෙවැනි පරිච්ඡේදයෙන් මා කළේ නිදහසට පදනම් වූ යුගයේ (1931–1947) ක්‍රියාත්මක වූ විෂය මාලා ප්‍රතිසංස්කරණ කටයුතු විමර්ශනය කිරීමය. ඒ යටතේ වැඩි අවධානයක් යොමු කළේ සමකාලීනව සිදු කරන ලද සමස්ථ විෂය මාලා සංවර්ධන ප්‍රයත්නයක් ලෙස හඳුන්වා දිය හැකි, අත්හදා බැලීමක් ලෙස ක්‍රියාත්මක කෙරුණු ග්‍රාමීය

අධ්‍යාපන ක්‍රමය (හන්දෙසීස ක්‍රමය) විස්තරාත්මකව විමසීමත්, 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභා වාර්තාවේ (කන්නන්ගර වාර්තාවේ) ද්විතීය පාසල් විෂය මාලාව හා බැඳුනු ප්‍රතිසංස්කරණ යෝජනා විමර්ශනය කිරීමත්ය.

ඉක්බිතිව එක තුන්වැනි පරිච්ඡේදයෙන් නිදහස ලැබූ තැන් සිට දශක දෙකක් (1948-1968) තුළ සිදු කරන ලද විෂය මාලා සංවර්ධන කටයුතු හා ඒවාට බලපෑ මානවීය හා භෞතික සාධකද ඓතිහාසික දෘෂ්ටිකෝණයකින් දශකයෙන් දශකය ගනිමින් විස්තරාත්මකව විමසුවෙමි. එහිදී සවිඥාණව සිදු කෙරුණු විෂය මාලා සංවර්ධන ක්‍රියාවලිය තුලින් කොතෙක් දුරට අධ්‍යාපන අරමුණු ඉටු කර ගැනීමට හැකි වූයේද යන්න විමර්ශනය කිරීමටද අමතක නොකළෙමි.

තදනන්තරව එක හතරවන පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ විෂය මාලා සංවර්ධන කටයුතු සඳහා මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම, එහි අරමුණු, එයට පැවරුණ භාරධූර කර්තව්‍යයේ ස්වභාවය හා වර්තමාන හි එම මධ්‍යස්ථානය ඉටු කරන සේවාවන්ද විස්තර කළෙමි.

1981 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා වලින් අපේක්ෂිත විෂය මා ලා සංශෝධන හා සංවර්ධන ක්‍රියාවලිය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම ද මෙම කොටසේදී සිදු කළෙමි.

ශ්‍රී ලංකාවේ විෂය මා ලා සංවර්ධන කටයුතු දියත් කිරීමේදී මතුවූ හා මතුවන ගැටළු ද එතැන් සිට පරීක්ෂා කෙරිනි. එහිදී කලින් කලට විෂය මාලා සංවර්ධනයේ මතුවූ ගැටළු වලට පිළියම් වශයෙන් ඉදිරිපත් කළ වැඩ පිළිවෙළ හා එහි සාර්ථක අසාර්ථක භාවයන්ද විමර්ශනය කර ඇත.

මීළඟට අධ්‍යයනයේ සියළු සොයාගැනීම් වල ඵලය වශයෙන් දැක්විය හැකි සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ වර්තමානයට හා අනාගතයට යෝග්‍ය විෂය මාලා

සැකසීමේදී හා එම කටයුතු දියත් කිරීමේදී අවධානය යොමු කළයුතු අංශ හා නව යෝජනා ඉදිරිපත් කර ඇත.

අවසන්හි දක්වා ඇති සමාලෝචනයෙන් පර්යේෂණ කාර්යයේදී ඒ ඒ අවස්ථාවේ මුහුණ ගැසුණු දුෂ්කර පිළිබඳව සමස්ථ වශයෙන් සලකා බලන විට තවදුරටත් කිව හැකි දේ සහ පසු පර්යේෂකයන්ට ඉඟිද දක්වා ඇත.